එළුවෙන් කාව්‍යබන්ධන කරණ්නන්ට

ඉතා ප්‍රයෝජනවත්වූ

සන්න සහිත

# ලකුණුසර

ලඞ්කාභිනවවිශ්‍රැත යන්ත්‍රාලයෙහි

මුද්‍රාඞ්කණ කරණලදී.

PRINTED BY

H. Jayatilaka.

COLOMBO,

1883.

D. Johannis Peiris

# නමව් මුනිසරණ

1 නමව් සත්මග කර කුළුණෙන් එකත්ම තමා
දුදසුන් නිවන්දක් වූ සැසි ලොඑකසරණ

2 පොරණලකණෙජරන් කුළුණැස් නොලදලෙව්හට
අටගණසදවත්අෑ ගුණදෙස්බිඳු දක්වම්

3 කොටාරමැයි සරසව්දෙවිය අටගණනම්
මෙයින් වෙන්බැඳුම් නැත් වෙන්මුවතිලෝතල මෙන්

4 ගණසදලකරනොදත දත නළුකවිකිවිසන්
වදන්මිණිපස්කැන් කන් වියතුන් නො ම සදන්නේ

---

1 සත්වග, සමස්තසත්වවර්ගයා; කුළුණෙන්, කරුණාවෙන්; තමාඑකත්මකර. තමාහාඑකාත්මකකොට; දුදසුන්, දුර්දර්ශීනින්; නිවන්දක්වූ, නිර්වාණප්‍රවිෂ්ටකලාවූ; ලොඑකසරණ, ලොවටඅසහාය සරණවූ; සැසි, ශාක්‍යසිංහවූසර්වඥයාහට; නමව්, නමස්කාරකරව්

2 පොරණලකණෙජරන්, පූර්වලක්ෂණාචාර්යවරය න්ගේ; කුළුණැස්නොලද, කරුණාචක්ෂුස්නොලද් දාවූ; ලෙව්හට, ලොකවාසිසත්වයාහට; අටගණසද වත්අෑ, අෂ්ටගණයෙහිශබ්දවස්තුආදිවූ; ගුණදෙස්, ගුණදොෂයන්ගේ; බිඳුදක්වම්, බින්දුප්‍රමාණයක්දර්ශනයකරවම්.

3 අටගණනම්, මේඅෂ්ටගණයනම්; සරසව්දෙවි ය, සරස්වතීදෙවියගේ; කොටාරමැයි, කොෂ්ඨාගා රයෙකි; මෙයින්වෙන්බැඳුම්නැත්, මේඅෂ්ටගණ යෙන් විනිර්මුක්තවූ බන්ධනයෙක්නම් නැත්මැයි (හේකුමක්මෙන්දයත්) වෙන්මුවතිලෝතලමෙන්, විෂ්ණුමයවූ ත්‍රෛලොක්‍යතලයමෙනි.

4 ගණසදලකරනොදත, ගණඡන්දස්අලඞ්කාර

5 නො දත ගතනිසඟකිවිවත්නි පදබඳනේ
තෙම්මකෙළෙනෙසැකර්ලේ වියත්සෙබෙකෙළිවත්වේ
6 ලා ගුණදෙස් සොයා පද *කිවියර වෙසෙසා
තෙමෙ ද ඉසුරුමත් වේ තිහුනාහට වැඩ වඩා
7 සුබබැඳුමැ කිවිදෙස් අණුවනුයේ මහවනස්
පලකුසුමෙන් නෙවුනා මහවල්හි ගිනිරෙණ් මෙන්

---

නොදත්තාවූ; දතනාඨකාවී, කාව්‍යනාටකාදත්තාවූ; කිවියන්, කවීන්ගේ; වදන්මිණිපස්කැන්, වචනනාමැති මාණික්‍යකුණ්ඩලාභරණයෙන්; වියතන්, ව්‍යක්තයන්ගේ; කන්නොමසඳන්නේ, කර්ණයෙහි නොසඳන්නේයි.

5 නොදතගත, ග්‍රන්ථනොදත්තාවූ; නිසඟකිවිවත්නි, නිසර්ගකවිත්වයෙන්; පදබඳනේ, පද්‍යබන්ධනයකරන්නේයි; තෙමෙ, තෙමේද; සැකර්ලේ, ශඞ්කානාමැතිවනයෙහි; කෙළෙනේ, ක්‍රීඩාකරන්නේයි; වියත්සෙබෙ කෙළිවත්වේ, ව්‍යක්තයන්ගේ සභායෙහි ක්‍රීඩාවසනුදවන්නේයි.

6 දෙස්සොයා, ගුණදෝෂාන්වේෂණයකොට; ගුණලා, සුශබ්දාදියබහා; පදකිවියර, පද්‍යබන්ධනයකරන්නාවූ කිවිතෙමේ; වෙසෙසා, විශේෂයෙන්ම; ඉසුරුමත්වේ, ඓශ්වර්‍ය්‍යමත්වේ; තිහුනාහට, සතුතිනායකයාහට; වැඩවඩා; අභිවෘද්ධිවර්ධනය කරන්නේයි.

7 කිවි, ප්‍රාඥය; † සුබබැඳුමැ, ශුභබන්ධනයෙහි; අණුදෙස්, මදමාත්‍රවූදෝෂයක්ඇත; මහවනස්වනුයේ, මහත්විනාශවන්නේයි (කුමක්මෙන්දයත්) පලකුසුමෙන්නෙවුනා; ඵලපුෂ්පයෙන්බබලන්නාවූ; මහවල්හි, මහවනයෙක්හි; ගිනිරෙණ්මෙන්, අග්නිස්ඵුලිඞ්ගයක්මෙනියි.

---

* බඳ සඳහර.

ප්‍රාඥයන් විසින්-පොත්

8 එබැවිනි දැහැ දෙස් සුලකුණු කර බඳු පද
කර සුදු විසකුණන් හා පිරිමැද මැද නිතිසිතින්

9 ගුරුලුහු ද යළ ගණ සියබස්හි වනු හෙ මෙසේ
විසිනා දනු පැණසර කියනෙම් සැටකවකිනෙක්

10 පසුමලකර දිග පිලිගුරු හරස්පිලි හා
පෙරමලකර ලුහු වේ තුණකර මෙයින් ගණනම්

11 මී දිය සඳ සුර සිරු වා ගුවන් ගිනි යන
ඉබුඅනිබුඅටගණ මේ පිළිවෙළින් හෙඑ දන්නේ

---

8 එබැවිනි, එහෙයින්; දැහැදෙස්, දෙෂයන්හැර; විසකුණන්හා, විචක්ෂණයන් සමග; සුදුකර, (ගුණදෙෂනිරීක්ෂණයෙන්) ශුද්ධකොට; නිතිසිතින්, නිරන්තරචෙතනාවෙන්; පිරිමැදමැද, පරිමර්දනය කොටකොට; සුලකුණුකර, ශ්ලක්ෂණකොට; බඳු පද, පද්‍යබන්ධනයකරාවි.

9 යළ, නැවත; ගුරුලුහුද, ගුරුලඝුද; ගණ, අෂ්ටගණද; සියබස්හිවනු, ස්වකීයභාෂාවෙහිපිම; හෙමෙසේ, ඒමෙසේයි; පැණසර, ප්‍රඥාසාරය; විසිනාදනු, පරීක්ෂාකොටදනුව; එක්සැටකවකින්, එකසැටක්කවියෙන්වූ පද්‍යප්‍රමාණයෙන්, කියනෙම් කථනයකෙරෙම්.

10 පසුමලකර, අන්තවසිටිමාත්‍රාක්ෂරයද; දිගපිලි, දීර්ඝවූපිලිහා; හරස්පිලි, හරස්*පිලිද; ගුරු, ගුර්වක්ෂරනම්වේ, පෙරමලකර, පූර්වයෙහිවූමාත්‍රාක්ෂරය; ලුහුවේ, ලඝුවෙයි; මෙයින්, මේඅක්ෂරයන්ගෙන්; තුණකර, ත්‍ර්‍යක්ෂරයෙන්; ගණනම්, ගණයෙක්වනුයේයි

11 මී, මඝගණය; දිය, ජලගණය; සඳ, චන්ද්‍රගණය; සුර, දිව්‍යගණය; හිරු, සූර්‍ය්‍යගණය; වා, වායුගණය; ගුවන්, ආකාශගණය; ගිනි, අග්නිගණය; යන, කියන්නාවූ ඉබුඅනිබුඅටගණ; මේඉෂ්ටානිෂ්ටඅෂ්ටගණය, පිළිවෙළින්; පටිපාටියෙන්, එ එදන්නේ; එඑයෙහිදන්නේයි.

* ග්‍රන්ථ-පොත්
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල

12 පටන් ගුරුතුන් බඳ මෙ මිගණ නම් වනුයේ
ඉති බැඳුමැ කිවි තියුනා මහඉසුරු යස පත්වේ

13 මෙ මිගණය පටන් යළ ගිනිගණය අවසන්
අටගණෙහි ගුරුලුහු පිළිවෙළ පවිම් ගෙහ මෙසේ

14 බෝසත් මෙන් රැක ලෝ වඩම්නි වැඩ වෙසෙසා
නරනිඳුවිරු රුදුරු දුරු මුළුකප්හිම් දිනේවා

15 නවකලුහු එක් දෙගුරෙනි බඳ හොත් දිය ගණනම්
යසතෙදින් ලෝ රඳනේ වෙසෙසා උසස්තැන්පත්

---

12 පටන්ගුරුතුන්බඳ, ප්‍රථමයෙහිගුරුත්‍රයක්ලා බඳනාලද්දේ; මෙමිගණනම්වනුයේ, මේමඝිගණ නම්වන්නේයි; කිවි, කවීහුගේ; ඉතිබැඳුමැ, මෙසේ බන්ධනයෙහි; නියුනා, ස්තුතිනායකතෙමේ; මහඉසුරු, මහත්වූඓශ්වර්‍ය්‍යයටහා; යස, කීර්තියට; පත්වේ, ප්‍රාප්තවේ.

13 මේමිගණයපටන්, මේමඝිගණය ප්‍රථමකොට ඇති; යළ, නැවත; ගිනිගණයඅවසන්, අග්නිගණයඅවසන්කොටඇති; අටගණෙහි, අෂ්ටගණයෙහි; ගුරුලුහු, ගුරුලඝු; පිළිවෙළ, පටිපාටිය; පවිම්, දක්වමි; ගෙහමෙසේ, ඒමෙසේයි.

14 බෝසත්මෙන්, බොධිසත්වයන්මෙන්; ලොරැකා, ලොකාරක්ෂණයකොට; වෙසෙසා, විශෙෂයෙන්; වැඩවඩම්නි, අභිවෘද්ධිවර්ධනයකෙරෙමින්; රුදුරු, රෞද්‍රභාවයදුරැවාවූ; නරනිඳුවිරු, නාරෙන්ද්‍රවීරතෙම, මුළුකප්හිම්; සකලකල්පාන්තය දක්වා, දිනේවා; ජයගණීවා.

15 නවකලුහුඑක්, ප්‍රථමකොටලඝුඑකක්හා; දෙගුරෙනි, ගුරුද්වයකින්; බඳහොත්, බඳනාලද්දේවී නම්, දියගණනම්; ජලගණයනම්වන්නේය, (ජලගණයෙන් බඳනාලද්දේ;) යසතෙදිනි ලෝරඳනේ, යසස්තෙජසින් ලොකරඤ්ජනයකරන්නේයි- වෙසෙසා, විශෙෂයෙන්; උසස්තැන්පත්, උච්චස්ථානයට පැමිණෙන්නේයි.

16 අසාමැනවිවි සහසාසපුනුත්නමා
උවනෙම්තිවිතම හටමෙලෙන්ඉතිවි *
17 පළමුගුරු එක් ලුහුසුවලෙක් වනෙ සඳගණ
යසරුසිරු වඩා නිති මුළුලෝසඳ බඳින්නේ
18 ලෝසියලු මෙ සමු දු මන දී බලන අපුනා
මෙ වත් මනු කරණ ගහණ සියසස් නයින් දුක්ද
19 ඉදිරියේ ලුහුනුණෙක් සුරගණනම් වනුයේ
මෙසින් බැඳුම්ලදහට අසකරබල වඩනේ
20 දගම්වුනත්දරණත් කල්ගුදිගුණනිවෙස්
මදකෝදුර[illegible]ජිඳුසරසිරිලක් ?ජ දිනේවා

---

16* අසා, ශ්‍රවණයකොට; මැනවිවි, යහපතැයිකියා; සහසා, සාහසිකව; සපුනුත්, ගිවිස්විය; තමාළුවනෙන්, තමාගේවක්ත්‍රයෙනි; ඉති, මෙසේ; ඉවි, අයිෂ්ටානකලී.

17 පළමුගුරුඑක්, ප්‍රථමයෙහිගුරුඑකක්හා; ලුහුසුවලෙක්වනෙන්, ලඝුවයෙක්වූයේවීනම්, සඳගණ; චන්ද්‍රගණනම්; (ඒමචන්ද්‍රගණයෙන්බැඳුම්ලද්දහට) නිති, නිරන්තරයෙන්; යසරුසිරුවඩා, යසස්ශාරූපශ්‍රීවඩීනයකරන්නේයි, මුළුලෝ, සකලලොකවාසීන්ගේ; සඳබඳින්නේ, චිත්තබන්ධනයකරන්නේයි.

18 සියලුලෝ, සකලලොකයද; මෙසමුදු, මේසකලසමයද; අපුනාමෙවත්මනු, අතීතානාගතවර්තමානයද; මනාදීබලන, සිත්ලාපරීක්ෂාකරන; ගහණකරණ, ග්‍රහණකරණයයි; සියසස්නයින්, සවසංඥවෙන්; දුක්ද, දුඃඛදායකයි.

19 ඉදිරියේලුහුනුණෙක්, අභිමුඛයෙහිලඝුත්‍රෙක්ඇත්තේ; සුරගණනම්වනුයේ, දිව්‍යගණනම්වන්නේයි—මෙසින් බැඳුම්ලදහට, මේදිව්‍යගණයෙන් බැඳුම්ලද්දහට; අසකරබලවඩනේ, ආයුසංස්කාරයහා බලවඩීනයකරන්නේ.

---

* අපට අමගුළු පිටපත් සියල්ලෙහිම මෙම ගීයෙහිද සනානයෙහිද ඌනබවපෙණේ-

දෙඅත්හි ලුහුදෙකින් මැදගුරු හිරුගණ නම්
නිරතුරු ගිලන්පිඩා සෝදුක්නි නො ම මුස්නේ

22 සමස්නි ලකණපදබැඳුමෙහි ඔදපණ නම්
කෙනෙක් පසයිත් එනියර පදබැඳුමෙහි දු මෙහෙ මෙසේ

23 නවකලුහුදෙක්නි යුත් ගුරෙක් පවන්ගණ නම්
උමුතු නුමුතු හෝ වේ සියතන්හි යේ නො පර්ස්

---

20 දහම්බු, ධර්මිෂ්ඨවූ හෙවත් ධර්මයෙහි පිහිටියාවූ; නන්දරණන්, අනාථයාගේ භොගයට බඳුවූ ගස්තා ඇති; කල්, කලණවූ; ගුදීගුණ, සත්පුරුෂගුණ සට; නිවෙස්, නිවෙසවූ; මදකෝදුරා, මදයෙන්හා ක්‍රොධයෙන්දුරුවූ; ගිජ්ඳුසර, ගජෙන්ද්‍රගතිඇති; සිරිලක්රජ, ශ්‍රීලඞ්කාවේ රජතෙමේ; දිනේවා, ජය ගනීවා.

මේ ඉවුසිවුගණයි

21 දෙඅත්හි, උභයාන්තයෙහි; ලුහුදෙකින්, ලඝුවයකින්හා; මැද, මධ්‍යයෙහි; ගුරු, ගුරුක්ඇත්තේ; හිරුගණනම්, සූර්‍ය්‍යගණනම්වන්නේය (සූර්‍ය්‍යගණයෙන්බැඳුම්ලද්දහට) නිරතුරු, නිරන්තරයෙන්; ගිලන්, ලෙඩහා; පිඩා, පීඩාහා; සෝදුක්නි, ශොකදුඃඛයෙන්; නොමමුස්නේ, අමුක්තවන්නේයි

22 සමස්නිලකණ, සමාසලක්ෂණයෙන්යුක්තවූ; පදබැඳුමෙහි, පදසම්බන්ධනයෙහි (වැටෙනප්‍රබන්ධය); ඔදපණනම්, ඔජස්ප්‍රාණනම්වන්නේයි- කෙනෙක්, සමහරකෙනෙක්; එනියර පසයිත්, ඒක්‍රමයප්‍රශස්තකෙරෙත්; පදබැඳුමෙහිදු, පදසම්බන්ධනයෙහිද; මෙහෙමෙසේ, ඒමෙසේයි.

23 නවකලුහුදෙක්නියුත්, ප්‍රථමකොටලඝුවයකින්යුක්තවූ; ගුරෙක්, අන්තයෙහිගුරෙක්ඇත්තේ; පවන්ගණනම්, වායුගණනම්වන්නේයි; (වායුගණයෙන්බැඳුම්ලද්දහට), නුමුතු, නිරන්තරයෙන්; උමුතුහෝ, උන්මාදහෝවන්නේයි; නොසරස්, වහාම; සියතන්හියේ, ස්වකීයස්ථානයෙන්යන්නේයි.

24 නිරිඳෙක් වී සිරින් සුරිඳෙව් දෙව්පුරවරෙරේ
යසකිරිතොයින් දේ බඹතලලකලබඹදත්

25 ඉදිරියේ ගුරුදෙක* ලුහුඅවසන් වී නම්
ගුවන් ගණ නම් වනුයේ සව්සිරිපෙදෙන් සිස්වේ

26 මීසේ කරගවැකි පස්කම්හි සිත් නො බඳු
යෙදෙව් දහම්කම්හි වෙසෙසින් දෙලෝවැඩද

27 මැදලුහුඑක්දෙකෙළෙනි දෙගුරුවණෙ ගිනිගණ
තියුනාගට ද කිවි ගිනිබියමරණ වේ වැනසුම්

---

24 යසකිරිතොයින්, යශස්නමැතික්ෂීරජලයෙන්; ලකළ, අලඞ්කෘතකළාවූ; බඹතල, බ්‍රහ්මතලය; දේ, ශුද්ධකළාවූ; සිරින්, ශොභාවෙන්; දෙව්පුරවරෙ, දිව්‍යපුරප්‍රවරයෙහි; සුරිඳෙව්, ශක්‍රයාවැනිවූ; බඹදත්, බ්‍රහ්මදත්තනම්වූ; නිරිඳෙක්ව්, නරේන්ද්‍රයෙක්වී.

25 ඉදිරියේ ගුරුදෙක, අභිමුඛයෙහි ගුරුවයක්හා; අවසන්ලුහුවීනම්, අවසානයෙහි ලඝුවෙක්වීනම්†; ගුවන්ගණනම්වනුයේ, ආකාශගණනම්වන්නේයි (මෙයින්බඳනාලදනුගේ) සව්සිරි, සශොභාවය; පෙදෙන්සිස්වේ, උත්පත්තීන්සූන්‍යවන්නේයි.

26 කරගවැකිමීසේ, ක්ෂුරාග්‍රයෙහිවිකනාලදමීබුබුලුවූ; පස්කම්හි, පඤ්චකාමයෙහි; සිත්නොබඳු, චිත්තබන්ධනයනොකරව්; වෙසෙසින්, විශෙෂයෙන්; දෙලෝවැඩද, උභයලොකාභිවෘද්ධියකවූ; දහම්කම්හියෙදෙව්, ධර්මකර්මයෙහි යොජිතවව්.

27 මැදලුහුඑක්, මධ්‍යයෙහිලඝුවක්හා; දෙකෙළෙ දෙගුරුවණෙ, දෙකොටියෙහිදෙගුරුවන්නේයි; ඒ ගිනිගණනම්, ඒඅග්නිගණනම්වන්නේයි–(මෙයින්බඳනාලද) තියුනාගටද, සතුතිනායකයාහටද; කිවි, කවිහටද, ගිනිබිය; ගිනිබියහා, මරණ; මරණයහා; වැනසුම්, විනාශද; වේ, වන්නේයි.

---

* දෙකට-පොත්. † ඉදිරියේගුරුදෙකට, අභිමුඛයෙහි ගුරුවයට, ලුහුඅවසන්වීනම්, ලඝුවෙන් අවසානවී නම්–පොත්–

28 නිලුවන්සසක්පිළිවක්සුවඳසිරිවත්පුල්
පියුමෙව් ලගනෙන් වියනෙක් මේ සෙලෙසුවම්

29 ඉති බැඳුමෙහි පටන් අවසන් යොඳ හරණ
සුසඳුදුසඳන් දන් එක්දෙස් කියම් හෙ මෙසේ

30 සුව සිරි පින් සුබ සුසිරි සතුටු අම ඔද
දිය වැඩ නදන් සොමිනස් පිවිතුරු වෙසෙස් යාපත්

31 දෙනේ දේ රුකේ පිනිවා ඉටා සුවවා
බබුලුවා සඳ සොඳ පැහැ දෙ බෙජෙ තිරවේ

---

28 නීලවන්සසක්පලිවන්, නීලශ්වේතත්‍රයසඝ්‍යාදී සාප්‍රතිපක්ෂවූ; සුවද, සුගන්ධවූ; සිරිමත්, ශ්‍රීමත්*වූ; පුල්පියුමෙව්, ප්‍රඵුල්ලපද්මයක්මෙන්, ලගනෙන්වියන්; හොබනෙන්සයිත්‍යත්, මේ ..ත් සෙලෙසුවම්; මේඑක ශෛලෝපමායකි.

මේ අනිමුසිවුගණයි

29 ඉති, මෙසේ; බැඳුමෙහි, බන්ධනයෙහි; පටන්අවසන්, ප්‍රථමාවසානයෙහි; යොඳුහරණ, යොදනාහරණ; සුසඳුදුසඳන්, ශුභශබ්දදුශ්ශබ්දයන්; එක්දෙස්, එකදෙශයකින්; කියම්, කථනයකෙරෙමි; හෙමෙසේ, එමෙසේයි.

30 සුව, සැපය; සිරි, සිරිය; පින්, පිණය; සුබ, ශුභය; සුසිර, සුචරිතය; සතුටු, සන්තුෂ්ටිය; අමඔද, අමෘතෞදය; දියවැඩ, ජගත්අභිවෘද්ධිය; නදන්, නිධානය; සොමිනස්, සෞමනස්සය; පිවිතුරු, පවිත්‍රය; වෙසෙස්, විශේෂය යාපත්; යැපතැ,

31 දෙනේ, දිනේය; දේ, ජවත්වේ; රුකේ, රක්ෂාවෙයි; පිනිවා, ප්‍රීණනාවෙයි; ඉටා, ඉෂ්ටයි; සුවවා, සුවෘත්තය; බබුලුවා, බැබලීය; සඳ, සජ්ජනය; සොඳ, සෞන්දර්‍යය; පැහැදේ, පැහැදේය; බෙජේ, ශෝභනය; තිරවේ, ස්ථිරවෙයි.

---

* නත-පොත්.

32 වැවේ වේ පවතී සිරිමත්මේ ඇ සදහා
සලි දු ලොවැටමෙන් ගෙණ තිසුබැඳුමෙහි යොදන්නේ

33 නුසුබ නො සිරි අකුසල්පව්දුසිරි නොසතුටු
නැසුම් දෙම්නස් අපවැඩ පීඩා මරණ දුක්හා

34 නොවේ නොතාවුරුනොහටා නොපිහිටායේ
කණගොලු බිහිරි පිළි පිළිකුල් කලි දුබුල් වේ

35 මිලි සැලුම් සෝ වැහැසුම් හැඬුම් ගිගුරුම් බැඳුම්
බිඳුම් වැනසුම් පහලු * නැති ඉති දුසද හරණේ

---

32 වැවේ, වර්ධනාවෙයි; වේ, වන්නේයි; පවතී, ප්‍රවෘතීනයවෙයි; සිරිමත්, ශ්‍රීමත් † යසනා; මෙ ඇස දහා, මේආදිවූශබ්දයන්හා; සලිදු, නැවතද; ලෝවැටමෙන්ගෙණ, ලොකප්‍රවෘර්තියෙන්ගෙණ; තිසුබැඳුමෙහියොදන්නේ; ස්තුතිබන්ධනයෙහි යොජනාකරන්නේයි.

මේශුභශබ්දයි

33 නුසුබ, අශුභයයිද; නොසිරි, අශ්‍රීයයිද; අකුසල්, අකුශලයයිද; පව්, පාපයයිද; දුසිරි, දුශ්චරිතයයිද; නොසතුටු, අසන්තුෂ්ටියයිද; නැසුම්, නැසුම්යයිද; දෙම්නස්, දෞර්මනස්‍යයයිද; අපවැඩ; අනභිවෘද්ධියයිද, පීඩා, පීඩායයිද; මරණ, මරණයයිද; දුක්හා, දුඃඛයයිද.

34 නොවේ, නොවේයයිද; නොතාවුරු, ස්ථාවර නොවේයයිද, නොහට, නොහටයයිද; නොපිහිටායේ, අප්‍රතිෂ්ඨායයිද; කණ, අන්ධයයිද; ගොලු, මූගයයිද; බිහිරි, බධිරයයිද; පිළි, පිළියයිද; පිළිකුල්, ප්‍රතික්කූලයයිද; කලි, කලියයිද; දුබුල්වේ, දුර්වලවේයයිද,.

35 මිලි, මලිනයයිද; සැලුම්, චචලයයිද; සෝ, ශෝකයයිද; වැහැසුම්, වැහැසුමැයිද; හැඬුම්, හැඬුමැයිද; ගිගිරුම්, ගිග්‍රිරුමැයිද; බැඳුම්, බන්ධනයයිද; බිඳුම්, [illegible] වැනසුම්, විනාශයයිද; පහව

---

* පාල-එක්ෂොතක † වනත-පොත්

36 ඉති මේසුබඅසුබ සද දුන තිසු බැඳුම්හි
පටන්අවසන් සුබසද සිවුවා හරු දුසදන්

37 ඉවු බැඳුමට සුමට සිරිසරමඟුල්වත්ඈ
නොමඟලවත් හරණ සැකවින් කියමි හෙ මෙසේ

38 බෝසත් බඹ උවිඳු මෙහෙසුරු දෙවිඳු මුනි ගුරු
සුරතුරු රුවන් බදකල ගෝ ගඟ මඟුල් මී මේ

39 මහසෙල් සෑ* විමන් නිරජ ගජ කුසුම්කැන්
රිවි සඳ සිරි සරසවි උමා සෙමෙර සක් සත්

---

පහලූයයිද; නැති, අවිද්‍යමානයයිද(යන); ඉති, මෙසේ (උක්තප්‍රකාරවූ); දුසදන්, දුශ්ශබ්දයන්; හරණෙ, දුරුකරන්නේය.

මේ අශුභශබ්දයි

36 ඉති, මෙසේ; මේසුබඅසුබසදදුන, මේශුභඅශුභශබ්දයන්දුන; තිසුබැඳුම්හි, සතුනිබන්ධනයෙහි; පටන්අවසන්, පූර්වාවසානයෙහි; සුබසදසිවුවා, ශුභශබ්දයන් ප්‍රතිෂ්ඨාකොට; දුසදන්හරු, දුශ්ශබ්දයන්හැරපියව්.

37 ඉවුබැඳුමට, ඉෂ්ටබන්ධනයට; සුමට, සුශ්ලිෂ්ටවූ; සිරි සරමඟුල්වත්ඈ, ශ්‍රීන්සාරවූ මඟලවස්තුආදියද; හරණනොමඟලවත්; හලමනාඅවමඟලවස්තුආදීයද: සැකෙවින්කියමි, සංක්ෂෙපයෙන්කථනයකෙරෙමි; හෙමෙසේ, එමෙසේයි.

38 බෝසත්, බොධිසත්වය; බඹ, බ්‍රහ්මය; උවිඳු, උපෙන්ද්‍රය; මෙහෙසුරු, මහෙශ්වරය; දෙවිඳු, දෙවෙන්ද්‍රය, මුනි; සර්වඥය, ගුරු; බෘහස්පතිය, සුරතුරු, කල්පද්‍රැමය; රුවන්, රත්නය; බදකල, භද්‍රඝටය; ගෝ, වෘෂභය; ගඟ, ගඞ්ගාය; මඟුල්, මඞ්ගල්‍යය; මී, මහීය; මේ, මෙඝය.

39 මහසෙල්, මහාශෛලය; සෑ, චෛත්‍යය; විමන්, විමානය; නිරජ, සමුද්‍රය; ගජ, හස්තිය; කුසු

---

* සත්-සමහරපොත්.

40 දියරම් කඳකුමර ලෝපල් වරුණු වෙසමුණු
මඬලග සැව් විදුරුඅවි ඉති ලොව මඟුල්වත් නම්

41 සුද ගිනි නල සෙන ගුවන් වළඹාමුව
නරක රකුස් බූ පිසස් යම සැඬොල වමඟු ල් *

42 අනුමසඳත් අනග අසුරිඳු හත්ගිරිඳු යළ
විගුරජ උමතු බල දෙව්සහස් කොටහෙ තිරිවුහත්

43 සිකුරු දුම්කෙහෙළි පලඟ නිවට ඉඳුදල්
මෙඈපටන් අවසන් බැඳුම් ගරුහත් වියතෝ

---

මිකැන්, පුෂ්පසන්තවකය; රිවි, සූර්‍ය්‍යය; සඳ, චන්ද්‍රය; සිරි, ශ්‍රීකාන්තාය; සරසවිය, සරස්වතිය; උමා. උමා දෙවිය; සෙමෙර, සෙතචාමරය; සක්, ශඞ්ඛය; සත්, ඡත්‍රය;

40 දියරම්, ජගත්රාමය; කඳකුමර, සකන්ධකුමාරය; ලෝපල්, ලොකපාලය; වරුණු, වරුණය; වෙසමුණු, වෛශ්‍රවණය; මඬලග, ඛඞ්ගය; සැව්, චාපය; විදුරුඅවි, වජ්‍රායුධය; ඉති, මෙසේ; ලොව, ලොකයෙහි; මගුල්වත්නම්, මඞ්ගල්‍යවස්තුනම්වේ.

මේමඞ්ගල්‍යවස්තුයි

41 සුද, ශුද්ධය; ගිනි, වහ්නිය; නල, මාරුතය; සෙන, අශනිය; ගුවන්, ආකාශය; වළඹාමුව, වඩබාමුඛය; නරක; නරකය, රකුස්, රාක්ෂසය; බූ, භූතය; පිසස්; පිසාචය, යම; යමය; සැඬොල්, චණ්ඩාලය: අවමගුල්, අවමඞ්ගල්‍යය

42 අනුමසඳත්; අනන්තය; අනග, අනඞ්ගය; අසුරිඳු, අසුරෙන්ද්‍රය; අත්ගිරිඳු, හස්තගිරිජවිතය; යළ, නැවත; විගුරජ, විග්‍රහය; උමතු, උන්මත්තය; බලදෙව්, බලභද්‍රය–

43 සිකුරු, සිකුරුය; දුම්කෙහෙළි, ධූමකෙතුය; පලඟ, රාහුය; නිවට, නිවටය; ඉඳුදල්, ඉන්ද්‍රජාලය; මෙඈ, මේ ආදී වස්තූන්; පටන්අවසන්, ප්‍රථමා

---

* සැඬොලුන්අවමඟුල්හා- පොත්

44 ඉති ඉටු නිටුවත් ලෝ වැටුමෙහුදු දැනගෙණ
දැහැ දෙස් බඳු වියතෑ වැඩවේ නැත වැන සුම්

45 උතුම් අගපදට පිරිනම් යොගින් පවසා
හිම් සඳ වැහැප් ගජ සී මහමල් ඉසුරු යන්නෙන්

46 දිනේ නිරිඳුසඳ සිට කප්හිම් සියදහස්
යළු සැරදේ රජ තෝ තා යසැරැසිනි දිය *රඳවා.

47 දෙවිඅගරජමහත්බැඳුම් කුදුවෙසෙස් දැන
කිරුළු සව්බරණම්ණි සුවන්කරු මෙන් බඳනේ.

---

වසානයෙහි; බැඳුම්, බන්ධනය; වියතෝ, ව්‍යක්තයෝ; ගරහත්, නින්දාකෙරෙත්.

මේ අවමංගල්‍ය වස්තුයි-

44 ඉති, මෙසේ; ඉටුනිටුවත්; ඉෂ්ටානිෂ්ටවස්තූන්; ලෝවැටුමෙහුදුදැනගෙණ; ලොකප්‍රවෘත්තියෙන්ද දැනගෙණ; වියතෑ, ව්‍යක්තය; දැහැදෙස්, දෙෂය න්ගැර; පදබිඳු, පදයබන්ධනයකරව; වැඩවේ, අභිවෘද්ධිවන්නේයි; නැතවැනාසුම්, නැතහොත් විනාශවන්නේයි,

45 උතුම්අගපදට, උත්තම්වූ අග්‍රපාදයට; පිරිනම් යොගින්පවසා, පූර්ණනාමයොගයෙන් ප්‍රකාශකොට, (කෙසේද යත්) හිම්සඳ, ස්වාමිචන්ද්‍රය, වැහැප්, වෘෂභය, ගජ, හස්තිය; සී, සිංහය. මහමල්, මහාමල්ලය, ඉසුරුයන්නෙන්, ඊශ්වරයයනාමෙයි නි, †

46 නිරිඳුසඳ, නරෙන්ද්‍රචන්ද්‍රය; කප්සියදහස්හි ම්, කල්පශතසහස්‍රයක්දක්වා; සිට, ස්ථිතව; දිනේ, ජයගන්නේයයිකියාද; යළු, නැවත; රජ, රාජ්‍යය; තෝ, තෝ වනාහි; තායස රැසිනිදියරඳවා, තාගේ යසසින්ජගත්රඤ්ජනයකොට; සැරදේ, චිරත්කාලයක්ජීවත්වයයිකියාද.

---

* යසදිසෙහිරඳවා–සමහර පොත්-

† [illegible] කිරියකාරී සබඳකෙලෙසද?

48 කුදුහට උතුම්උවම් උතුම්හට කුදුඋවම් පැව හොත්
සරණාබරණකිරුළුමිණි සුවන්කරු මෙන් බඳනා

49 වැජඹි හුඹමඬලේ සිසිබිඹු මෙන් කදෝකිමි
සළු සරාරිවිමඬල කදෝකිමි මෙන් රඳනේ,

50 ඉවුඅතටබැදිපද ලෙසින් අනිවුඅත් වත්
නොබඳනේ බඳුමහදොස් එයට දිවුඅත් කියම්හේ මෙමෙසේ

51 වඩා දප රැපුත් කලඹා ඝන විසුරුවා
දිනමඬල මඩිමින් වැජඹි සිරසර කිමිසඳහුකාශ

---

47 දෙව්අගරජ, දෙවතාවන්හා අග්‍රරාජයන්සො රෙහි; මහත්කුදුබැඳුම්වෙසෙස්දන, මහත්වූත්ක්ෂුද්‍ර වූත්බන්ධනාවිශෙෂඥනා; කිරුළුසව්බරණමිණි, කිරීටයෙහිහා සර්වාභරණයෙහි මාණික්‍යය; (සුදුසුසේබ න්ධනයකරන්නාවූ) සුවන්කරුමෙන්, සවර්ණකාර යාමෙන්, බඳනේ, බන්ධනයකරන්නේයි

48 කුදුහට, ක්ෂුද්‍රයාහට; උතුම්උවම්, උත්තමවූඋප මාද, උතුම්හට; උත්තමයාහට, කුදුඋවම්, ක්ෂුද්‍රවූඋප මාද; පැවහොත්, (කාව්‍යකාරයා) දක්වූවහොත්; සරණාබරණ, පාදාභරණයෙහි; කිරුළුමිණි, කිරීටමා ණික්‍යය; බඳනා, බඳින්නාවූ, සුවන්කරු මෙන්, සවර්ණකාරයකුමෙනි.

49 කදෝකිමි, ඛද්‍යොතකෘමිතෙම; හුඹමඬලේ, නාගභොමණ්ඩලයෙහි; සිසිබිඹුමෙන්වැජඹි, චන්ද්‍රබිම්බ යමෙන් විභ්‍රාජිතවූයේ; සළු, නැවත; සරාරිවිමඬ ල, සරත්සූර්‍ය්‍යමණ්ඩලය; කදෝකිමිමෙන්, ඛද්‍යො තකෘමිමෙන්; රඳනේ, රාජමානවන්නේයි.

50 ඉවුඅතටබැදිපද, ඉෂ්ටාර්ථයට බැන්ඳවූ පද්‍යය, ලෙසින්අනිවු අත්වත්, ලෙසෙකින් අනිෂ්ටාර්ථවූව හොත්; නොබඳනේ, බන්ධනය නොකරන්නේයි- බඳුමහදොස්, බන්ධනකලහොත් මහාදොෂවන්නේ යි; එයට, ඒ බන්ධනයට; දිවුඅත්කියම්, දෘෂ්ටාන්ත කියම්, එමෙසේ, ඒ මෙසේයි.

52 යමක්නු නම් බැදිපද සදබෙදී ගිනි නම්
නොසරස් මහවනස් වේ කියනෙම් ඊට දිමුහත්.
53 දියපතළ තෙද කිත්සිරි මේ නිරිඳුපුන්සඳ
රුපඳුරැඳුරු කර යෙහෙන් මුළුකප්හිම් දිලෙන්වා,
54 සවිහන්සතරකුරෙන් පදන එකකුරෙක් වත්
එයට ඉදිරි කර කිසිඑකකුරු නො පැව මහදොස්.
55 මහලෙලමලුත් ලූන් මිහයිම්සතැවු ලී ය
එකින්දෙකින් දිරියබලරුකුහාමි ලී ය
බරහා අඟුනු එමමනතැන්නේ දී ලී ය
තුරලිය කෝමල එමවිනෙවට නොමි ලී ය

---

51 සිරසර, සිරන්සාරවූ; හිමිසඳහු, ස්වාමි චන්ද්‍රයාගේ; ඛග, ඛඩ්ගය තෙම; දපවඩා, දර්පවර්ධනය කොට; රුපුන් කලඹා, ශත්‍රූන් අලලා; යස විසුරුවා යශෝවිස්තීර්ණ කොට; දියමඬලමඬිමින්, ජගන්මණ්ඩලය මණ්ඩනය කරමින්; වැජඹී, විජෘම්භිතවී.

52 යමක්නුනම් බැදිපද යමක්නුගේ නාමයා බැදිපද; සදබෙදීගිනිනම්, බඳනාලද බන්ධනයෙහි නාමයහා ඡන්දස භග්නව හෙවත් භින්නවෘත්තයේ නාම්; නොසරස්, විනාම; මහවනස්වේ, මහා විනාශවන්නේයි-ඊටදිමුහත්කියනෙම්, ඊට දෘෂ්ටාන්ත කියමි.

53 දියපතළතෙද, ජගත්හි පතළාවූ තේජස් ඇති; කිත්සිරිමේනිරිඳුපුන්සඳ, කීර්තිශ්‍රී මේඝවර්ණ නම්වූ පූර්ණචන්ද්‍ර තෙම; රුපඳුරැඳුරුකර, ශත්‍රූන් නැති අන්ධකාරය දුරුකොට; යෙහෙන්, සුවසුවයෙන් හෙවත් සැපසේ; මුළුකප්හිම්, සකලකල්පාන්තය දක්වා; දිලෙන්වා, ප්‍රකාශවේවා.

54 සවිහන්සතරකුරෙන්, සවිහන් යන සතර අක්ෂරයෙන්; පදනඑකකුරෙක්වත්, පදනාමයෙහි එක් අක්ෂරයක්වත්; එයටඉදිරිකර, ඒ අක්ෂරයන්ට අභිමුඛකොට; කිසි, කවරවූ; එකකුරු, නොපැව, එක අක්ෂරයද නොවැඩුවහොත්; මහදොස්, මහාදෝෂයි; (එයට උපමා මෙසේයි.)

56 තිසුනාහු නම වලා එළා අන්වතෙක් හි
නොබඳු බෙදෙන් පද ඕහට වැඩ දුරින් දුර.

57 අලකුරු මෙලේ දන් පදඅත්හි නොම සිටුවව්
කජටතපරන් සව්වග අකරන් ම සිටුවන්නේ.

58 කළලෙහි නදන් මෙ ලකුණු මිණි යුත්වියත්හට
සිනෙනුදු දිළිදුබැව් නොම වේ වේ වියත්බැව්.

---

55 මහලෙලමලුන්දුන්, මහාලුමයවූවන්දුන්නාවූ; සතැවුිරියමහගිම්, සන්තාපනමැති මහාඝර්මයෙහි; දිරියබලරුකුහා, ධෛර්‍ය්‍යබල නාමැති වෘක්ෂයෝ පවා; එකින්දෙකින්මිලිය, එකින්දෙකින්මලානිකභාවයට ගියෝය; එමමනතැන්නෙන්දිළිය, එම මන නාමැති තොසාලවාලයෙහි ජනිතවූ; තුරලිය, අඩුණු ගලතාවෙහි; කොමල, මෘදුවූ ශාඛා; එවපින්වට නොමැලිය, නොමැලිනා; අඟුනුබරගා, පරීක්ෂාකාරත්ගොත්, බැරිසේහා.*

56 පිසුනාහුනමවලා, සනුහිනායකයාගේ නමසඟවා; අන්වතෙක්හිහෙලා, අනික් වස්තුවෙක්හිතබා; බෙදෙන්පදනොබඳු, ව්‍යාජයෙන් පදසම්බන්ධනය නොකරව්; ඕහටවැඩදුරින්දුර, ඕහට අභිවෘද්ධිය දුරින්දුරයි.

57 අලකුරුමෙලේදන්, අල් අක්ෂරය මෘතාක්ෂරයයි දනුව; පදඅත්හිනොමසිටුවව්, පදාන්තයෙහි නොසිටුවව්; කජටතපරන්සව්වග, කවර්ග ජවර්ග ටවර්ග තවර්ග පවර්ගයෙහි; අකාරන්මසිටුවන්නෙන් අක්ෂරයන්ම සිටුවන්නේයි.

58 මෙලකුණුමිණි, මේලක්ෂණ නාමැතිමාණික්‍යය; ලෙහි, හෘදයෙහි; නදන්කළ, නිධානකළාවූ සුත්වියත්හට, යුක්තවූ ව්‍යක්තයාහට; දිළිදුබැව්, දරිද්‍රභාවයෙන්; සිහිනෙනුදුනොවේ, ස්වප්නයෙනුත්නොවන්නේයි; වියත්බැව්වේ, ව්‍යක්තභාවයමවන්නේයි.

ලකුණුසර නිමි.

---

* මෙහි [illegible]නාඩියක් පෙණෙ